**රුහුණ විශ්වවිද්‍යාලය - 2021**

**----------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

රුහුණ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් සහ සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත් පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 99 ඡේදය ප්‍රකාරව, සියලුම ආදායම් අතිරික්තය හෝ ඌනතාවයට ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් ආපසු අය කර ගැනීම්, අය කර තිබුණු බැඳුම්කර වටිනාකම් සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම් එකතුව රු.17,202,390 ක් ආදායම් ලෙස හඳුනා නොගෙන ඉන් රු.15,869,102 ක් බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීමේ අරමුදල් ගිණුමට හා රු.1,333,288 ක් අග්‍රහාර රක්ෂණ අරමුදල් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් රු.17,202,390 කින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් සහ සංචිත පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි. | 1998/8/18 දිනැති අංක 737 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අය කර ගන්නා සියලු මුදල් වෙනම අරමුදලක් පවත්වා ගෙන ආයෝජනය කළ යුතු අතර එමඟින් උපයන ලද ආදායම් පමණක් උපයෝජනයට ප්‍රතිපාදන සලසා ඇති හෙයින්ද, එදිනෙදා මෙහෙයුම් ක්‍රියාකාරකමක් මඟින් ජනිත වූ ආදායමක් නොවන හෙයින්ද, විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කළ නොහැකි බව, කාර්යමණ්ඩල බැඳුම්කර හා ගිවිසුම් කඩවීම මඟින් ලද මුදල්, අරමුදල් ගිණුමට බැර කර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති බව හා උත්පාදිත අරමුදල් මඟින් උපයන පොලී ආදායම පමණක් අග්‍රහාර රක්ෂණ දායක මුදල් ගෙවීම සඳහා 2018.12.10 දිනැති අංක 2018/15 හා 2018.12.10 දිනැති දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව අග්‍රහාර රක්ෂණ අරමුදලට බැර කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම | කොවිඩ් වසංගත තත්ත්වය නිසා තක්සේරු වාර්තා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබීමේ ප්‍රමාදයක් පවතින බව හා එම වාර්තා ලැබීමෙන් පසුව අදාළ වාහනවල | -එම- |

| | |
|---|---|
| හේතුවෙන් පිරිවැය රු.6,880,250 ක් වූ වාහන 08 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකම ලබාගත හැකි බව. |

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු විලම්භිත ආදායම රු.244,076,700 ක් වූ අතර ඒ ඒ වර්ෂය සඳහා හඳුනාගත යුතු ආදායම ක්‍රමක්ෂය කර නොතිබීම හේතුවෙන් ඉන් රු.20,544,858 ක් වර්ෂ ගණනාවක සිට නොවෙනස්ව පැවතුණි. | ස්වයං මූල්‍යාන ක්‍රියාකාරකම් යටතේ වූ විලම්භීත ආදායම රු.223,531,842 ලෙස දක්වා ඇත්තේ ප්‍රවර්තන වර්ෂයට අදාළව විලම්බිත ආදායම් ගිණුමට මාරු කළ මුදල වන බව හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත්තේ 2021 දෙසැම්බර් 31 දිනට ආරම්භක ශේෂයන්ද ඇතුළු විලම්බිත ආදායම වන බව. | වර්ෂ ගණනාවක සිට පැවත එන නිශ්චිතව හඳුනානොගත් ශේෂය හඳුනාගෙන නිවැරදිව ගැලපීම් කළ යුතුය. |

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම පරිශ්‍රයේ, හපුගල ඉංජිනේරු පීඨයේ හා මාපලාන කෘෂි පීඨයේ ස්ථාපිත කර තිබුණු සන්නිවේදන කුළුණු වෙනුවෙන් අයවිය යුතු කුලී මුදල | 3,930,000 | අදාළ සන්නිවේදන සමාගම සමඟ විශ්වවිද්‍යාලය එළඹි එකඟතා ගිවිසුම. | මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් සන්නිවේදන ආයතනය වෙත යොමු කර ඇති බව. | දෙපාර්ශවය අතර එළඹි එකඟතා ගිවිසුම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

1.6 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 08 කදී පොත් හා සඟරා මිලදී ගැනීම සඳහා විදේශීය සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලෙස | මෙම නොපියවූ අත්තිකාරම පිළිබඳව සිදුකළ විශේෂ අභ්‍යන්තර විගණනයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පාලක සභා අනුමැතියට ඉදිරිපත් කර ඇති බව හා | පොත් හා සඟරා සපයා ගැනීමට හෝ ගෙවූ මුදල් ආපසු අයකර |

| | | |
|---|---|---|
| රු.553,695 ක් ගෙවා තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඇණවුම් කළ පොත් හා සඟරා ලැබී නොතිබුණි. නමුත් එම පොත් හා සඟරා සපයා ගැනීමට හෝ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට කළමනාකාරීත්වය අපොහොසත්වී තිබුණි. | පාලක සභාවේ අනුමැතිය ලද විගස මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව. | ගැනීමට කටයුතු කළ යුතුය. |

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 394 (ඇ) | විශ්වවිද්‍යාලයේ පීඨ හා ඒකක 05 කට අදාළව 2019, 2020 සහ 2021 වර්ෂවලදී අවලංගු කර තිබුණු රු.932,643 ක්වූ නිකුත් කළ චෙක්පත් 138 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4(II) ඡේදය | පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස 06 ක් ඇතුළත පර්යේෂණ ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වර්ෂ 04 කදී පර්යේෂණවල ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් එම කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු කරාපිටිය වෛද්‍ය පීඨයේ අධ්‍යයනාංශ 17 ක අධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරීන් 358 දෙනෙකු වෙත එකතුව රු.137,268,775 ක් වූ සම්පූර්ණ පර්යේෂණ දීමනාව ගෙවා තිබුණි. | මාස 06 කට වරක් පර්යේෂණ යෝජනාවට අදාළව ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් ලබා ගැනීම ප්‍රායෝගිකව අපහසු වන නමුත් ඉදිරියේදී එපරිදි කරන බව. | කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | වාහන අපහරණය කිරීමෙන් ලැබෙන සියලුම මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවද, ඉකුත් වර්ෂවලදී වාහන විකිණීමෙන් ලැබී තිබුණු රු.5,203,365 ක් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. | වාහන විකිණීමේ අරමුදල් ශේෂය රාජ්‍ය ආදායමට බැර කිරීමට 2022 වර්ෂයේදී අවශ්‍ය කටයුතු කරන බව. | රාජ්‍ය මුදල් හා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 2016 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අත් ට්‍රැක්ටරය හා ටේලරය විධිමත්ව අපහරණය කිරීමට 2022 මැයි 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අත්ට්‍රැක්ටරය භාවිතයෙන් ඉවත් කර අපහරණය කිරීම සඳහා පාලන අංශය දැනුවත් කර ඇති බව. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, 2021 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.174,331,393 ක් වූ පරිගණක මෘදුකාංග හා දෘඩාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | විශ්වවිද්‍යාලය සතු පරිගණකගත කළ ස්ථාවර වත්කම් ලේඛනය මගින් පරිගණක මෘදුකාංග හා දෘඩාංග පිළිබඳ දත්ත හා තොරතුරු ලබාගැනීමට හැකියාව පවතින බව. | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර පරිගණකගත කළ ස්ථාවර වත්කම් ලේඛනය නිසි ලෙස සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2019 ජූලි 25 දිනැති අංක SC & PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | වෙනත් රාජ්‍යයන්, විදේශ සංවර්ධන පාර්ශවකරුවන් හා විදේශ ආයතන විසින් ලබා දෙන විදේශ ප්‍රදානයන් හා ශිල්පීය ආධාර, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගෙන මුදල් රෙගුලාසි 610 සිට මුදල් රෙගුලාසි 626 දක්වා වූ උපදෙස් ප්‍රකාරව කටයුතු කරමින් උපයෝජනය කළ යුතු වුවද, කරාපිටිය වෛද්‍ය පීඨයේ පරපෝෂි විද්‍යා අධ්‍යයනාංශය වෙත ලැබී තිබුණු රු.51,591,900 ක විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් එපරිදි කටයුතු නොකර බරවා රෝගීන් සම්බන්ධයෙන් සිදුකර තිබුණු ව්‍යාපෘතියක් සඳහා උපයෝජනය කර තිබුණි. | මෙම මූල්‍ය ප්‍රදානයන්ට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව පමණක් ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,452,308,690 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.293,250,162 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,159,058,528 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන මෙන්ම දේශීය හා විදේශීය පරිත්‍යාග ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අවශ්‍යතාවයට වඩා වැඩිපුර තොග මිලදී ගැනීම හේතුවෙන් 2022 ජුනි 23 දින වන විට පිරිවැය රු.99,092 ක් වූ තීන්ත ලීටර් 161 ක් කල් ඉකුත්වී වැල්ලමඩම නඩත්තු තොග ගබඩාව තුළ තබා තිබුණි. | 2020 වර්ෂයට අවශ්‍ය අවම තීන්ත ප්‍රමාණය සැලකිල්ලට ගෙන මිලදී ගැනීම සිදුකළ නමුත් කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් මාස කිහිපයක් විශ්වවිද්‍යාලය වසා තැබීමට සිදුවීම නිසා අපේක්ෂිත පරිදි නඩත්තු කටයුතු සිදු කර ගැනීමට නොහැකි වීමෙන් මෙසේ සිදුවූ බව. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගෙන මිලදී ගැනීම් සිදුකළ යුතු අතර මිලදී ගැනීමෙන් පසු අපතේ නොයන ලෙස පාවිච්චි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) වැල්ලමඩම පරිශ්‍රයේ හා එයට අයත් නේවාසිකාගාරවල සමාලෝචිත වර්ෂයට අදාළ විදුලි බිල්පත් සඳහා නියමිත කාලය තුළදී ගෙවීම් කර නොතිබීම හේතුවෙන් රු.53,137 ක දඩයක් ගෙවීමට සිදුවී තිබුණි. ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට හා ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | එවකට රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා ගෙවිය යුතු විදුලි ගාස්තු නියමිත පරිදි ගෙවීමට නොහැකිවූ බව, කොවිඩ් වසංගත තත්ත්වයන් සැලකිල්ලට ගෙන මෙම දඩ මුදල් වලින් විශ්වවිද්‍යාලය නිදහස් කරන ලෙස ඉල්ලීමක් ලංකා විදුලිබල මණ්ඩලයෙන් සිදු කිරීමට කටයුතු කරන බව. | අදහස් දක්වා ඇති පරිදි කටයුතු කර මෙම දඩ මුදල් වලින් විශ්වවිද්‍යාලය නිදහස් කර ගැනීමට හෝ වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජුනි 17 දිනැති 413 වන පාලක සභා තීරණය මගින් 2020 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි ඉහළ දමා තිබුණු බදු ප්‍රතිශත පදනම් කරගෙන 2020 ජනවාරි සිට 2021 ඔක්තෝබර් මාසය දක්වා වූ මාස 22 සඳහා වැල්ලමඩම පරිශ්‍රයේ බදු නිවාස වලින් අයවිය යුතු හිඟ බදු රු.3,498,300 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ බදු මුදල් අයකර ගැනීම සිදුකරන ආකාරය සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා කරමින් පවතින බව හා වාරික වශයෙන් එම මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් පිහිටුවා තිබුණු අග්‍රහාර රක්‍ෂණ අරමුදල් ගිණුම තර කර ගැනීම සඳහා ඉකුත් වර්ෂවලදී සැපයුම්කරුවන්ගෙන් අයකර තිබුණු ප්‍රමාද ගාස්තු රු.10,000,000 ක් යොදාගෙන තිබුණි. | අග්‍රහාර රක්ෂණය සඳහා යොදාගෙන ඇත්තේ විශ්වවිද්‍යාලයට භාණ්ඩාගාරයෙන් ලද මුදල් නොව ගිවිසුම් කඩකළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගත් මුදල් බව. | සැපයුම්කරුවන්ගෙන් අයකරන ප්‍රමාද ගාස්තු විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතුය. |

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 341.60 ක් වූ වැල්ලමඩම පරිශ්‍රයේ ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීම සහ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීමේ කර්මාන්තයේ පස් පරීක්ෂා කිරීම සඳහා රු.200,750 ක් ද, ප්‍රසම්පාදන කමිටු දීමනා ලෙස රු.85,000 ක්ද ලංසු පිළියෙල කිරීමේ දීමනා ලෙස රු.243,576 ක්ද වශයෙන් 2017 සහ 2018 වර්ෂවලදී රු.529,326 ක් වැයකර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 21 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කළ බවත්, කැබිනට් අනුමැතිය ලැබුණු බවත්, ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලෙසත් දැන්වීමෙන් අනතුරුව මූලික වැඩ කටයුතු සඳහා රු.529,325 ක් වැයකළ බව හා ලංසු ඇගයීම් කටයුතු අවසන් වන විට 2020 සැප්තැම්බර් 14 දින මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබුණු කැබිනට් සංදේශය සලකා බලා මෙම ව්‍යාපෘතිය වෙනත් අදියරකදී ආරම්භ කරන ලෙසට කැබිනට් අනුමැතිය ලබාදී තිබුණු බැවින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ නොහැකි වූ බව. | වැය කළ මුදල් නිශ්කාර්ය වියදම් බවට පත් නොකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 400.42 ක් වූ වැල්ලමඩම පරිශ්‍රයේ පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රධාන නවීකරණ කටයුතු වෙනුවෙන් උපදේශක සේවා වෙනුවෙන් හා තාක්‍ෂණික ඇගයීම් කමිටු දීමනා ලෙස 2020 වර්ෂයේදී රු.1,898,164 ක් වැය කර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 21 දින වන විටත් එම නවීකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ ගොඩනැගිල්ලම පුනරුත්ථාපන වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කළ බව, වාර්ෂික අවසන් ගිණුම් පිළියෙල කරමින් පැවති බැවින් මූල්‍ය අංශය එසේ එකවර ලබා දිය නොහැකි වූ බව, එම අංශය හැර අනෙකුත් නිදහස් කළ හැකි අංශවල වැඩ ආරම්භ කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත උපදෙස් ලබා දුන් බව, කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් මුදල් ඉල්ලුම් කර තිබුණු නමුත් එවකට පැවති මූල්‍ය අපහසුතා හේතුවෙන් අත්තිකාරම් ලබාදිය නොහැකි වූ බව, 2021ජනවාරි හා පෙබරවාරි මාසවලදී පවත්වා තිබුණු ප්‍රසම්පාදන කමිටුව හා පාලක සභාව විසින් ද්වීපාර්ශවීය එකඟතාවයක් මත කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට තීරණය කළ බව. | -එම- |